# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,753 - 2012 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2012.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 824 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 833 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 838 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අප්‍රේල් මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### මීගමුව මහ නගර සභාව

මීගමුව මහ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2012.05.05 වැනි දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | ඕවර්සියර් (කර්මාන්ත) | 01 | MN1-2006 A<br>ආරම්භක වැටුප් පියවර රු. 13,120/=<br>4 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (සටහන 01 බලන්න) |
| 02. | මාර්ග කම්කරු (කා.සේ.සේ.111) | 05 | PL1-2006 A<br>ආරම්භක වැටුප් පියවර රු. 11,730/=<br>4 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 5 ශ්‍රේණිය/ 6 වසර සමත් වී තිබීම. |
| 03. | සෞඛ්‍ය කම්කරු (කා.සේ.සේ.111) | 10 | PL1-2006 A<br>ආරම්භක වැටුප් පියවර රු. 11,730/=<br>4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 04. | ගබඩා කම්කරු (කා.සේ.සේ.111) | 01 | PL1-2006 A<br>ආරම්භක වැටුප් පියවර රු. 11,730/=<br>4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 8 වන ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබීම. |

*සටහන 01* .- ඕවර්සියර් (කර්මාන්ත) තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් :

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ගණිතය/ වාණිජ අංක ගණිතය/ ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම;

*හෝ*

ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම;

*හෝ*

පළාත් පාලන ආයතනයකට අවුරුදු 10කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වන පන්තිය සමත්වී තිබීම.

*සේවා කොන්දේසි හා නියමයන් .-*

(අ) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය;
(ආ) වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.ද;
(ඇ) තෝරාගනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01 ක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවාගනු ලැබේ.

*වෙනත් පොදු කොන්දේසි .-*

01. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.),
02. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය,
03. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ,
04. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතු ය,
05. අයදුම්පත් කැඳවන දින වන විට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතු ය,
06. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය.-* ඕවර්සියර් (මාර්ග) තනතුරට සුදුසුකම් ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ප්‍රකාර සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන පැය 01ක ප්‍රශ්න පත්‍රයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

2. මාර්ග කම්කරු, සෞඛ්‍ය කම්කරු සහ ගබඩා කම්කරු තනතුරු සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/95 ට අනුකූලව සම්මුඛ පරීක්ෂණයට කැඳවීමෙන් තෝරාගනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මීගමුව.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*මීගමුව මහ නගර සභාව*

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

........................................................ *තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. මුලකුරු සමග නම : ——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් : ——————————.
3. ජාතික හැඳුනුම්පත් අංකය : ——————————.
4. ස්ථිර පදිංචි ලිපිනය: ——————————.
5. තැපැල් ලිපිනය: ——————————.
6. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය: ——————————.
7. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ——————————.
8. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය: ——————————.
9. උපන් දිනය: ——————————.
10. 2012.05.05 දිනට වයස: ——————————.
11. අධ්‍යාපන සුදුසුකම්: ——————————.
12. පළපුරුද්ද: ——————————.
13. වෘත්තීය සුදුසුකම් : ——————————.
14. වෙනත් සුදුසුකම්: ——————————.
15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කර තිබේ ද යන වග: ——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත් බඳවාගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත් යටත්වන බව හොඳාකාරවම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන............................................................... මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ............................................ වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

——————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ——————————.
තනතුර : ——————————.
දිනය : ——————————.
04-217/2

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

මීගමුව මහ නගර සභාව

මීගමුව මහ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති නගර ශාලා භාරකරු (ශිල්පීය නොවන) තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළිවෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2012.05.05 වැනි දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

*තනතුරු සංඛ්‍යාව* .- 01

*වයස් සීමාව* .- අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය. රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර සේවකයන් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

*අධ්‍යාපන සුදුසුකම්* .- අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය 9 වැනි වසර සමත්වී තිබීම.

*වැටුප් පරිමාණය*.- රා.ප.ච. 6/2006(IV) හි PLI ආරම්භක වැටුප මාසික - රු. 11,730 කි. 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා නියමයන් :*

(*අ*) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය;
(*ආ*) වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය;
(*ඇ*) තෝරාගනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01 ක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවාගනු ලැබේ.

*වෙනත් පොදු කොන්දේසි .-*

01. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය;
02. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ;
03. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතු ය;
04. අයදුම්පත් කැඳවන දින වන විට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතු ය;
05. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබුවකු නොවිය යුතු ය.

*සේවා කොන්දේසි හා නියමයන් :*

I. පත්වීම් ලබන්නන් ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කළ පනවනු ලබන කොන්දේසිවලට හා නියෝගවලට ද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥාපනත් /පනත්වල විධි විධානවලට ද පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතු ය.

II. බඳවා ගනු ලබන්නන් අංක 7/2007 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අදාළ භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛක අංක 24/95 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ලකුණු ලබාගැනීමේ ප්‍රමුඛතාවය මත සුදුස්සන් තෝරාගනු ලැබේ.

ගරු බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමාගේ 1/6/3/204 හා 2009.05.27 දිනැති ශිල්පීය නොවන තනතුරුවලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 2 වැනි උපලේඛනයේ පරිදි ව්‍යුහගත පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු ඇත.

නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
මීගමුව.

ආදර්ශ අයදුම්පත්‍රය

*මීගමුව මහ නගර සභාව*

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

*........................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. මුලකුරු සමග නම : ————————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් : ————————————.
3. ජාතික හැඳුනුම්පත් අංකය : ————————————.
4. ස්ථිර පදිංචි ලිපිනය: ————————————.
5. තැපැල් ලිපිනය: ————————————.
6. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය: ————————————.
7. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ————————————.
8. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය: ————————————.
9. උපන් දිනය: ————————————.
10. 2012.05.05 දිනට වයස: ————————————.
11. අධ්‍යාපන සුදුසුකම්: ————————————.
12. පළපුරුද්ද: ————————————.
13. වෘත්තීය සුදුසුකම් : ————————————.
14. වෙනත් සුදුසුකම්: ————————————.
15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කර තිබේ ද යන වග: ————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත්, බඳවාගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත් යටත්වන බව හොඳාකාරවම දනිමි.

————————————.
අයදුම්කරුගේ අත්සන

දිනය : ————————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන............................................................ මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.......................................... වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

————————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ————————————.
තනතුර : ————————————.
දිනය : ————————————.

04-217/1

---

## බොරලැස්ගමුව නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බොරලැස්ගමුව නගර සභාවේ දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය දරන අයවලුන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ :-

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | මාර්ග කම්කරු III ශ්‍රේණිය | 10 | රු.11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 - රු.17,600/= (රා.පරි. චක්‍ර 6/2006)(IV) PL1-2006A වැටුප් පරිමාණයේ 01 වැනි පියවර ආරම්භක පියවර වශයෙන් සැලකේ. 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (i) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය - 9 වසර සමත්ව තිබීම. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 08 | රු.11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 12 x 160 - රු.17,600/= (රා.පරි. චක්‍ර 6/2006)(IV) PL1-2006A වැටුප් පරිමාණයේ 01 වැනි පියවර ආරම්භක පියවර වශයෙන් සැලකේ. 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (i) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය- 9 වසර සමත්ව තිබීම. |
| 03 | කාර්යාල කම්කරු III ශ්‍රේණිය | 01 | රු.11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 12 x 160 - රු.17,600/= (රා.පරි. චක්‍ර 6/2006)(IV) PL1-2006A වැටුප් පරිමාණයේ 01 වැනි පියවර ආරම්භක පියවර වශයෙන් සැලකේ. 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (i) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය -9 වසර සමත්ව තිබීම. |

*04. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකාවේ පුරවැසියන් විය යුතුය.

(ii) අයදුම්කරුවන් බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(iv) රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.

(v) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(vi) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන සේවකයින් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

(vii) බොරලැස්ගමුව නගර සභාවේ දැනටමත් අනියම්/ආදේශක හෝ ව්‍යාපෘති මට්ටමින් සේවයේ යෙදෙන සතුටුදායක සේවා තත්ත්වයකින් යුතු අය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

*05. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අරමුදල යටතේ වන දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.

(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව, ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය කොමිෂන් සභාවේ හෝ බොරලැස්ගමුව නගර සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*06. බඳවා ගැනීමේ ක්‍රමය :-*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90ට අනුව සුදුසුකම් පරීක්ෂා කෙරෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් පවත්නා පුරප්පාඩු ප්‍රමාණයට බඳවා ගනු ලැබේ.

*අයදුම්කළ යුතු ආකාරය :-*

මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ආකෘතිය පරිදි (12"x 8" ප්‍රමාණයේ) අයදුම්පත් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2012.04.30 දිනට පෙර "ලේකම්, බොරලැස්ගමුව නගර සභාව, බොරලැස්ගමුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දින පසුවී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය :-

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
4. මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකයක්,
5. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්,
6. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික.

ගර්නල් ඩයස් නානායක්කාර,
ලේකම්,
බොරලැස්ගමුව නගර සභාව.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බොරලැස්ගමුව නගර සභාවේ***
***පුරප්පාඩු පවතින ........................................................................තනතුර සඳහා බඳවා ගැනීම***

1. මුලකුරු සමග නම : ——————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් : ——————————.

2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ————————————.
3. ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම : ————————————.
4. ස්ථිර ලිපිනය : ————————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය : ————————————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය : ————————————. විවාහකද/අවිවාහක ද යන වග : ————————————.
7. උපන් දිනය: ————————————.
   අවුරුද්ද : ——————. මාසය : ——————. දිනය : ——————.
8. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස: අවුරුදු : ——————. මාස : ——————. දින : ——————.
9. බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කාලය: ————————————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙකු ද නැත්ද යන වග: ————————————.
11. අධ්‍යාපන සුදුසුකම්(සමත් වූ විභාග පිළිබඳ විස්තර): ————————————.
   (1) සමත් වූ වසර/ශ්‍රේණිය: ————————————.
   (2) අ.පො.ස. (සා.පෙළ) විභාගය: ————————————.
   විභාග අංකය: ————————————.
   විභාග වර්ෂය හා මාසය: ————————————.

*සමත් වූ විෂයයන් ඃ*

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *1.*<br>*2.*<br>*3.*<br>*4.* | | *5.*<br>*6.*<br>*7.*<br>*8.* | |

   (3) අ.පො.ස. (උ.පෙළ) විභාගය: ————————————.
   විභාග අංකය: ————————————.
   විභාග වර්ෂය හා මාසය: ————————————.
   සමත් වූ විෂයයන්: ————————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| *1.*<br>*2.*<br>*3.*<br>*4.* | |

12. වෘත්තීමය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය) : ————————————.
13. සේවා පළපුරුද්ද : ————————————.
   (i) දැනට සේවය කරන ආයතනය : ————————————.
   (ii) දැනට දරන තනතුර : ————————————.
   (iii) එම තනතුරට පත්වූ දිනය : ————————————.
   (iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර : ————————————.
14. ඔබ උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද ? : ————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. තවද මා කිසිදු අධිකරණයකින් වැරදිකරුවෙකු වී දඬුවමකට යටත් වී නොමැති බවත් මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ————————————.

*දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන.......................................................... මහතා/මහත්මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.......................................... වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය තෝරා පත්කර ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත් නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ————————————.
පදවි නාමය: ————————————.
දෙපාර්තමේන්තුව/ආයතනය : ————————————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය : ————————————.

04-251

**කටුනායක - සීදූව නගර සභාව**

බස්නාහිර පළාතේ, පළාත් රාජ්‍ය සේවයේ කටුනායක - සීදූව නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට අදාළ සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර "ලේකම්, කටුනායක- සීදූව, නගර සභාව සීදූව" යන ලිපිනයට 2012.05.10 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර එවිය යුතු ය. අසම්පූර්ණ ඉල්ලුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| 03. *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| කාර්යාල කම්කරු (කා. සේ. සේ. III පංතිය) | 01 | රු. 11,730-10x120-10x130- 10x145- 12x160 - රු. 17,600 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වී තිබිය යුතු ය. |
| වීථි පහන් දල්වන්නා (ශිල්පීය නොවන III) | 01 | රු. 11,730 -10x120 - 10x130 - 10x145 - 12x160 - රු. 17,600 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත්වී තිබිය යුතු ය. |
| මාර්ග කම්කරු (කා. සේ. සේ. III පංතිය) | 04 | රු. 11,730 -10x120 - 10x130 - 10x145 - 12x160 - රු. 17,600 | අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය/6 වසර සමත්වී තිබිය යුතු ය. |

04. *වයස් සීමාව.-* ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

05. *පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු ය.
(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 3ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතු ය.
(v) මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

06. *බඳවා ගැනීමේ ක්‍රමය.-* සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/95 අනුව සිදුකරනු ලබන විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගැනේ.

වීථි පහන් දල්වන්නා තනතුර සඳහා සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ශිල්පීය නොවන තනතුරුවලට බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

07. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. නව බඳවා ගැනීම් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(iv) හි පීඑල් 1-2006-ඒ පරිදි රු. 11.730-10x120 - 10x130-10x145 -12x160- රු. 17,600 පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු. 11,730ක් වූ වැටුප් පියවරේ පිහිටවනු ලබන අතර 04 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.
(iii) වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
(iv) තෝරාගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවා ගනු ලැබේ.
(v) ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද බස්නාහිර පළාත් සභා මුදල් රෙගුලාසිවලට ද ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව සියලුම සේවකයන් බැඳී සිටිය යුතු ය.
(vi) වීථි පහන් දල්වන්නා තනතුර සඳහා බඳවා ගනු ලබන්නන් 7/2007 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අදාළ භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතු ය.

08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතු ය :-

(i) උප්පැන්න සහතිකය,
(ii) පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
(iii) අධ්‍යාපන සහතික.

එම්. ඩී. එස්. ප්‍රසාදිනී,
ලේකම්,
කටුනායක සීදූව නගර සභාව.

2012 ජනවාරි මස 24 වැනි දින.

කටුනායක - සීදූව නගර සභාව

**...................... තනතුර සඳහා අයදුම් කිරීම**

01. *(අ)* මුලකුරු සමග නම :————————.

*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————————.

*(අ)* ස්ථිර පදිංචි ලිපිනය :————————.

දුරකථන අංකය :————————.

*(ආ)* කාර්යාලයීය ලිපිනය :————————.

දුරකථන අංකය :————————.

03. (i) උපන් දිනය

(ii) 2012......... දිනට වයස :

අවුරුදු :————————, මාස :————————, දින :————————.

04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————————. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————.

05. විවාහක/අවිවාහක බව :————————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.

07. අධ්‍යාපන සුදුසුකම් :————————.

08. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————————.

09. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද ? එසේ නම් එම විස්තර :————————.

ම විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත්, මෙ තනතුර සඳහා මා නුසුදුස්සෙකුවීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

මෙම ආයතනයේ ................. තනතුර දරන ................... මයා./මිය./මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————————.

04–140

## මාතර මහ නගර සභාව

මාතර මහ නගර සභාවේ කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය සඳහා පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| කම්කරු | 20 | රා. ප. ච. 6/2006(iv) PL 1-2006 රු. 11,730- 10x120 - 10x130 - 10x145 - 12x160 - රු. 17,600 | අවම වශයෙන් 5 ශ්‍රේණිය සමත් වී තිබීම |

*පොදු සුදුසුකම්* :-

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතු ය.
(ii) අයදුම්කරු මාතර මහ නගර සභා බල ප්‍රදේශය තුළ අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.) (මාතර මහ නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ අයදුම්කරුවන්ට පමණක් මාතර බල ප්‍රදේශයේ පදිංචිවීම අනිවාර්ය නොවේ.)
(iii) මාතර මහ නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.
(iv) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(v) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ. එහෙත් එම තනතුරට බඳවා ගන්නා දිනට උපරිම වයස ඉක්මවා නොතිබිය යුතුයි.)
(vi) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය* :-

(i) සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.
(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයට යටත් වන අතර එක් වසරක (01) අනියම් පදනම මත බඳවා ගැනේ. අනියම් පදනම මත වසරක සේවා කාලයකින් පසුව කාර්ය සාධනය පරීක්ෂා කිරීමෙන් අනතුරුව වැඩ, පැමිණීම සහ හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයන්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

*ඉල්ලුම් කළයුතු ආකාරය*.- අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙළ කරන ලද අයදුම්පතක් 2012.05.15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "කම්කරු තනතුර (කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය සඳහා)" යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල මාතර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි :-

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතු ය.),
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,

(v) පළපුරුද්ද පිළිබඳ සහතික,

(vi) මාතර මහ නගර සභාවේ කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

රංජිත් යාපා,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව, මාතර.

2012 මාර්තු මස 19 වැනි දින,
මහ නගර සභාව, මාතර.

ආදර්ශ අයදුම්පත්‍රය

**කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ කම්කරු තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
3. තැපැල් ලිපිනය :——————————.
4. උපන් දිනය :——————————.
   වර්ෂය :——————————, මාසය :——————————, දිනය :——————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
   අවුරුදු :——————————, මාස :——————————, දින :——————————.
7. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
8. විවාහක/අවිවාහක බව :——————————.
9. ජාතිය :——————————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන්ද යන වග :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් :——————————.
12. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.
13. ඔබ දැනටමත් මාතර මහ නගර සභාවේ කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ සේවය කරන්නේ නම් :-
    (i) දැනට දරන තනතුර :——————————.
    (ii) එම තනතුරට පත් වූ දිනය :——————————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත ද) ? :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

04-119

# පළාත් පාලන නිවේදන

**කුරුවිට ප්‍රාදේශීය සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනත (272 වැනි අධිකාරිය)

2012.01.06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 4(ආ) කොටසේ පළවූ පහත උපලේඛනයේ සඳහන් ගෝඝාතකාගාර සඳහා බලපත්‍ර ලබාදීමට විරෝධතා කැඳවූවද අදාල කාලසීමාව තුළ විරෝධතා කිසිවක් නොවූයෙන් අදාල බලපත්‍ර ඉල්ලුම්කරුවන් වෙත එම බලපත්‍ර 2012 වසර දක්වා ලබාදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රේමරත්න මල්කැකුළ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2012 මාර්තු මස 16 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අයදුම්කරුගේ නම සහ ලිපිනය* | | *ගෝ ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* |
|---|---|---|
| 01. | එම්. එස්. එම්. ගවුස්,<br>තලාවිටියවත්ත,<br>ඇහැලියගොඩ. | අංක 19, උඩහගම, තලාවිටියවත්ත,<br>ඇහැලියගොඩ. |
| 02. | ඒ. ඒ. එම්. නසාර්,<br>අංක 155,<br>මලව, කුරුවිට. | මංකඩහේන,<br>මලව,<br>කුරුවිට. |

04-38

---

**ගම්පහ මහ නගර සභාව**

1975 අංක 17 දරන සමාජ ශාලා පනත 1987 අංක 38 දරන සමාජ ශාලා බලපත්‍ර ලබාදීමේ (සංශෝධිත පනත)

පහත නම් සඳහන් අය විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පවත්වාගෙන යාම සඳහා 2012 වර්ෂයට බලපත්‍ර ලබාගැනීම පිණිස මා වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බැවි 1975 අංක 17 දරන සමාජ ශාලා පනත සහ 1987 අංක 38 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධන) පනතේ 6 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී සමාජශාලාව අසල පදිංචි යම් අයෙකු එම සමාජශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළමුවන දින සිට සති හතරක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු ලිඛිතව දක්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වමි.

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *සමාජශාලාවේ ලේකම් ද, කළමනාකරුද, සභාපතිද, යන වග* | *සමාජ ශාලාවේ නම* | *සමාජශාලා කටයුතු කරගෙනයාමට බලාපොරොත්තුවන ස්ථානය* |
|---|---|---|---|
| ජේ. විමල්ගමගේ මයා,<br>ශාන්ති පාර,<br>ගම්පහ | ලේකම් | ගම්පහ ක්‍රීඩා සමාජ ශාලාව | 15/2/1<br>මංගල පාර |

කේ. එම්. ඩබ්ලිව්. ප්‍රේමචන්ද්‍ර,
නාගරික කොමසාරිස්.
ගම්පහ මහ නගර සභාව.

04-01

---

**කඩුගන්නාව නගර සභාව**

නගර සභා ආඥාපනතේ 255 වැනි අධිකාරයේ 49,50 හා 52 වැනි වගන්ති ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 වැනි අධිකාරයේ 49, 50 හා 52 වැනි වගන්ති ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුගන්නාව නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඩුගන්නාව නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාල දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාලසීමාව තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් පාරවල් කඩුගන්නාව නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එස්. කේ. අබේසිරිවර්ධන,
සභාපති,
නගර සභාව - කඩුගන්නාව.

2012 මාර්තු මස 21 වැනි දින,
කඩුගන්නාව නගර සභා කාර්යාලයේ දී ය.

**කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ මාර්ග ලියාපදිංචි කිරීම**

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | | අවසානය | | දිග | පළල |
|---|---|---|---|---|---|---|---|
| | | දකුණ | වම | දකුණ | වම | කි. මී. | මී. |
| 1. | පහළ කඩුගන්නාව රජපිහිල්ල පාර | 100/5, බෝක්කුව, රේන්කෝ කුඩ කර්මාන්තය | මහින්දරත්න ඕවිටිගල,170B කොළඹ පාර, කඩුගන්නාව, බැලුංගල එස්ටේට් | පාරමිතා බෞද්ධ මධ්‍යස්ථානය | මොහොමඩ් වාහිඩ් මොහොමඩ් අංක 16, රජපිහිල්ල පාර කඩවත්ගම ,කඩුගන්නාව | 0.49 | 2.45 |
| 2. | තානායම් පාර | කැප්ටන් ඩෝසන් කුළුණ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | දුම්රිය දෙපාර්තමේන්තුව | ඊ. විතාරණ, අංක 03 ගම්පල පාර, කඩුගන්නාව. | දුම්රිය දෙපාර්තමේන්තුව | 0.11 | 2.45 |
| 3. | කඩුගන්නාව ඩෝසන් කුළුණ අසල සිට සී. සී. දෙමල විදුහල් පාර | කැප්ටන් ඩෝසන් කුළුණ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | දුම්රිය දෙපාර්තමේන්තු නිල නිවාස | වික්ටර් ගුණතිලක | ගොඩගම | 0.26 | 2.40 |
| 4. | දැලිඅංග මාර්ගය | බීආරච්චි, අංක 21, ගම්පොල පාර කඩුගන්නාව. | ෆැල්කන් හාඩ්වෙයාර් ගම්පොළ පාර, කඩුගන්නාව. | රාජපක්ෂ හිස් ඉඩම | කඳුපළාත සමුපකාර ගබඩාව | 0.17 | 2.50 |
| 5. | ශාන්ත සේවියර් දේවස්ථානයේ සිට බැලුංගල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරිල්ල හා පඩිපෙල | ශාන්ත සේවියර් පල්ලියවත්ත සහ ගම්පොළ පාර | ශාන්ත සේවියර් පල්ලිය | අංක 18/72, මයිකල් ආරෝග්‍ය මේරි, 180සී, පල්ලියවත්ත කඩුගන්නාව, පල්ලියවත්ත. | BMK ඒකනායක 172ඒ, පල්ලිය වත්ත, කඩුගන්නාව. බබානි ෆ්‍රැන්සිස්, 180ඩී පල්ලියවත්ත, කඩුගන්නාව | 0.30 | 2.40 |
| 6. | සතිපොල පාර | කඩුගන්නාව නගර සභාව | දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් | වීරසිරි මුදලාලි | ඇල මාර්ගය (1/5 බෝක්කුව) | 0.24 | 3.50 |
| 7. | කඩුගන්නාව නාවුල්ල පාර | නගර සභා ඉඩම | නගර සභා ඉඩම | පිහිල්ල | පිහිල්ල | 0.21 | 2.40 |
| 8. | වලකඩවත්ත කිරිබෝව මාර්ගය | ධර්මසර විහාරය | කඩුගන්නාව නගර සභා ක්‍රීඩා පිටිය | E.P.U.D. ලියනගේ අංක71/ඒ, කඩවත්ගම කඩුගන්නාව. | ඊ. පී. ගාමිණී ලියනගේ කඩවත්ගම, කඩුගන්නාව | 0.43 | 2.40 |
| 9. | විහාරවත්ත පාර | අජත් සුමනසේන කඩවත්ගම, කඩුගන්නාව | අයි. ජේම්ස්, අංක 58/ඒ කඩවත්ගම, කඩුගන්නාව | එම්. ආර්. නජීමා, අංක 104/5, විහාරවත්ත කඩුගන්නාව | එම්. එස්. එම්. ජබ්බාර්, අංක 104/ඒ, විහාරවත්ත කඩුගන්නාව | 0.36 | 3.50 |
| 10. | මඩරංගොඩ ජාතික නිවාස මාර්ගය | ජී. ඩබ්ලිව්. ජී. සෙනෙහෙලතා, අංක 6/1, මඩරන්ගොඩ, කඩුගන්නාව. | ප්‍රජා ශාලාව කඩුගන්නාව | එම්. ජේ. එම්. රාෆික් ලගමුව පාර, මඩරංගොඩ කඩුගන්නාව. | විජේසිංහ මයා, අංක 13,ලගමුව මඩරන්ගොඩ, කඩුගන්නාව. | 0.14 | 2.40 |
| 11. | ෆිනෑන්ස්වත්ත පාර | ග්‍රීන් වීව් රෙස්ටුරන්ට්, කොළඹ පාර, කඩුගන්නාව. | ඉන්සෙල් ලංකා හෝටලය, කොළඹ පාර, කඩුගන්නාව | ටී, ජී. සුසන්ත සේනාරත්න, 707, මඩරන්ගොඩ, කඩුගන්නාව. රාජවත්ත | ඩබ්ලිව්. ජී. මෛත්‍රීපාල අංක 303 ඒ, දෙනගමුවවත්ත, මඩරන්ගොඩ, කඩුගන්නාව. | 0.35 | 2.40 |
| 12. | මඩරංගොඩ ගම මැද අතුරු පාර 1 | ඉන්සෙල් ලංකා හෝටලය, කොළඹ පාර, කඩුගන්නාව | ටී. ජී. සුසන්ත සේනාරත්න 707, මඩරන්ගොඩ කඩුගන්නාව. රාජවත්ත. | ඩබ්ලිව්. ජී. එස්. ජී. ජයන්ත, 306/එෆ්/1 මඩරන්ගොඩ කඩුගන්නාව. | ටී. ජී. සුසන්ත සේනාරත්න අංක 707 මඩරන්ගොඩ, කඩුගන්නාව, රාජවත්ත. | 0.22 | 2.40 |

| අනු අංකය | මාර්ගයේ නම | ආරම්භය | | අවසානය | | දිග | පළල |
|---|---|---|---|---|---|---|---|
| | | දකුණ | වම | දකුණ | වම | කි. මී. | මී. |
| 13. | මඩරංගොඩ ගම මැද අතුරු පාර 2 | කුමාරි දිසානායක, මඩරන්ගොඩ, කඩුගන්නාව | ජේ. බෝපගේ, අංක24, මඩරන්ගොඩ, කඩුගන්නාව. | ඩයමන්ඩ් ගිනිපෙට්ටි කර්මාන්ත ශාලාව, නුවර පාර, ඉලුක්වත්ත, | ටී, ජී. සුසන්ත සේනාරත්න, අංක 707, මඩරන්ගොඩ, කඩුගන්නාව, රාජවත්ත | 0.33 | 2.4/1.8 |
| 14. | මුදලිවත්ත ෆාම්වත්ත මාර්ගය | දුම්රිය දෙපාර්තමේන්තු රක්ෂිතය | දුම්රිය දෙපාර්තමේන්තු රක්ෂිතය | නගර සභා ඉඩම, | ප්‍රේමවතී රූපසිංහ මුදලි වත්ත පාර, කඩුගන්නාව | 0.63 | 2.40 |
| 15. | රේන්කෝ කුඩ කර්මාන්ත ශාලාව අසලින් දිවෙන මාර්ගය | රේන්කෝ කුඩ කර්මාන්තය, පහළ කඩුගන්නාව | පාර, කඩුගන්නාව ෆාම් එස්ටේට් | රේල් පාර, දුම්රිය දෙපාර්තමේන්තු රක්ෂිතය | රේල් පාර, දුම්රිය දෙපාර්තමේන්තු රක්ෂිතය | 0.30 | 2.40 |
| 15ඒ. | රේන්කෝ කුඩ කර්මාන්ත ශාලාව අසලින් දිවෙන මාර්ගය 2 කොටස | දුම්රිය දෙපාර්තමේන්තු රක්ෂිතය | දුම්රිය දෙපාර්තමේන්තු රක්ෂිතය | ඒ. එල්. ඒ. ආරියවතී අංක 173/4/1, ෆාම් එස්ටේට්, මුදලි වත්ත, කඩුගන්නාව | ඒ. එල්. ඒ. ආරියවතී අංක 173/4/1, ෆාම් එස්ටේට්, මුදලි වත්ත, කඩුගන්නාව | 0.13 | 2.40 |
| 16. | සීලානන්ද මාවත | ගුණවර්ධන, අංක 227, නුවර පාර, කඩුගන්නාව | මාලනී පෙරේරා, 225, නුවර පාර, කඩුගන්නාව, දෙල්ගහකුඹුර | ජේ. ආර්. ලියනගේ 443, අලගල්ල පාර, කඩුගන්නාව, ඉල්ලදොර හේන | ඩබ්. ඩී. වික්‍රමසිංහ අංක 442, අලගල්ල පාර, කඩුගන්නාව | 0.36 | 2.40 |
| 17. | කදංගම උතුර ගම මැද පාර | මංගලිකා මාරසිංහ, අංක 297, කදන්ගම, කඩුගන්නාව, මැදපිටිය වත්ත. | චන්ද්‍රලාල් රත්නායක, 485, කදංගම, කඩුගන්නාව සියඹලාගහවත්ත | එස්. පී. ගුණසේකර, 484/ඒ, කදංගම, කඩුගන්නාව - බෙරවාදෙනිය | ඩී. ආර්. ලියනගේ අංක 443/3, කදංගම, ඉල්ලදොර හේන කඩුගන්නාව | 0.11 | 2.40 |
| 18. | කිතුල්ගහමුල සිට හේනාවල දක්වා මාර්ගය | ඒ. ඒ. ජේ. අතපත්තු අංක 165, කදංගම, කඩුගන්නාව - තිගොලකුඹුර | එච්. ආර්. එම්. අබේරත්න අංක281, කදංගම කඩුගන්නාව | ආර්. එම්. රණසිංහ බණ්ඩා 275 කදංගම කඩුගන්නාව | එච්. ආර්. එම්. අබේරත්න අංක 281 කදංගම කඩුගන්නාව | 0.22 | 2.4/1.8 |
| 19. | රාජාවත්ත කොටබෝගොඩ කුඹල්වත්ත පාර | පී. පී. සීලවතී අංක 5/4, රාජවත්ත කඩුගන්නාව | යු.පී. කුමාර කීර්ති 10/6 රාජවත්ත කඩුගන්නාව රාජවත්ත | 1. අළුත් ළිඳ පොදු ළිඳ 2 එන්. පී. කුසුමාවතී 31 කොටබෝගොඩ කඩුගන්නාව දිවලෙ ඉඩම | 1. එච්. පී. සෝමරත්න අංක 255 කොටබෝගොඩ කඩුගන්නාව 2. ඒ. දසනායක අංක 247 කොටබෝගොඩ, කඩුගන්නාව. | 0.38 | 2.4/1.2 |
| 20. | රාජාවත්ත පාර | කඳුරට කුඩ කර්මාන්ත ශාලාව | ඩබ්. ආර්. එම්. පී. විජේසේකර, 682 රාජවත්ත කඩුගන්නාව | විජේකෝන් 224 රාජවත්ත කඩුගන්නාව | එම්. කේ. කරුණාරත්න අංක 225/ඩී, රාජවත්ත කඩුගන්නාව | 0.29 | 3.50 |
| 21. | ගෝවින්දල කදංපොල පාර | නිල්ලගොඩ මයා ගෝවින්දල පිළිමතලාව | නිල්ලගොඩ මයා ගෝවින්දල, පිළිමතලාව | ජයසේන ඇඹිල්මිගම පිළිමතලාව | ගාමිණී ජයරත්න අංක 466 ගෝවින්දල, පිළිමතලාව | 0.35 | 2.43 |
| 22. | වී. අලෙවි මණ්ඩල පාර | පී. ජී. කිරිබණ්ඩා, අංක 415, ගෝවින්දල පිළිමතලාව | පී. ටී. බී. ඔලිවර් ගෝවින්දල පිළිමතලාව | එච්. ජී. ජේම්ස් ගෝවින්දල පිළිමතලාව | චින්තක විමල් ගෝවින්දල පිළිමතලාව | 0.34 | 2.40 |
| 23. | දවුලගල පාරේ සෙනෙවිරත්න කඩය අසල සිට වී අලෙවි මණ්ඩල පාර | කේ. ජී. සෙනෙවිරත්න අංක 416/ඩී, කපිල ස්ටෝර්ස්, පිළිමතලාව | ඩබ්. ජේ. වීරසිංහ, 416, ගෝවින්දල පිළිමතලාව | එච්. ජී. ජෙම්ස් ගෝවින්දල, පිළිමතලාව | චින්තක විමල් ගෝවින්දල පිළිමතලාව | 0.10 | 1.80 |

| අනු අංකය | මාර්ගයේ නම | ආරම්භය | | අවසානය | | දිග | පළල |
|---|---|---|---|---|---|---|---|
| | | දකුණ | වම | දකුණ | වම | කි. මී. | මී. |
| 24. | දිග්ගල කොළණි පාර දෙවන පටුමග | ඩී, පී. ජයසිංහ දිග්ගලේ ගෙදර ගෝවින්දල | ඒ. පී. රත්නදාස දිග්ගල ජනපදය ගෝවින්දල පිළිමතලාව | කේ. ජී. කාන්ති ප්‍රේමලතා අංක 1/490 දිග්ගල ජනපදය | ගමගේ ධර්මදාස දිග්ගල ජනපදය | 0.24 | 2.45/1.2 |
| 25. | දිග්ගල කොළණි පාර පළමු පටුමග | ඩබ්ලිව්. එම්. වීරකෝන් ගෝවින්දල පිළිමතලාව | බී, ජී. චන්ද්‍රරත්න අංක 500/ඒ ගෝවින්දල පිළිමතලාව | සේමරත්න බණ්ඩා දිග්ගලේ ජනපදය | ඇන්ටන් ප්‍රේමවංශ, 478 දිග්ගලේ ජනපදය ගෝවින්දල, පිළිමතලාව | 0.13 | 2.13 |
| 26. | ගෝවින්දල අංක 250-254 නිවාස අතරින් යන මාර්ගය | ඩබ්. එම්. ඒ. එස්. විජේසුන්දර,431 ගෝවින්දල පිළිමතලාව | එස්. එම්. ඒ. කේ. රත්නායක 31/1 ගෝවින්දල පිළිමතලාව | ඒ. ජී. ඒ. එන්. කුලසිංහ 435/ඒ ගෝවින්දල පිළිමතලාව | ඩබ්. එම්. පී. බණ්ඩාර 432 ගෝවින්දල, පිළිමතලාව පිළිමතලාව | 0.08 | 2.40 |
| 27. | නවලිඅංග වැව දක්වා පාර | ඊ. එන්. ධනපාල අංක 213සී, කොළඹ පාර, පිළිමතලාව | යූ. එල්. එම්. නසීර් 213, කොළඹ පාර පිළිමතලාව | නවලිඅංග වැව | නවලිඅංග වැව | 0.82 | 3.00 |
| 28. | පඩරුල්දෙණිය සුසානභූමි පාර | ඒ. එම්. රම්බණ්ඩා ඩී/410 ගෝවින්දල පිළිමතලාව | ඒ. එම්. රම්බණ්ඩා ඩී/410 ගෝවින්දල පිළිමතලාව | ඩබ්ලිව්. එම්. සෙනෙවිරත්න බණ්ඩා 83, පඩරුල්දෙණිය, පිළිමතලාව | ඩී. උපාලි සමරකෝන් 82, පඩරුල්දෙණිය පිළිමතලාව | 0.52 | 2.43 |
| 29. | කලාදුරුකොටුව මාර්ගයේ සිට දඹගැටේ ඇලවේල්ල පාර | කලාදුරුකොටුව වත්ත, නගර සභා ඉඩම | විමලසේන සකුරා මෝටර්ස් කොළඹ පාර පිළිමතලාව | උඩුනුවර සීමාව | උඩුනුවර සීමාව | 0.16 | 2.40/0.9 |
| 30. | අක්කර අට මාර්ගය | කේ. ගමගේ, 49 ඉළුක්වත්ත, පිළිමතලාව, හපුගස්කුඹුරවත්ත | එම්. එච්. එම්. ජවුෆර්, 34, ඉළුක්වත්ත පිළිමතලාව | එච්. ජී. එස්. සුමනසිංහ,62ඒ, කහඹේ, පිළිමතලාව නාදෙනියවත්ත | ඩබ්ලිව්. ඩබ්ලිව්. වික්‍රමසිංහ 64/ඒ කහඹේ, පිළිමතලාව | 0.95 | 3.00 |
| 31. | බුද්ධගයා මාවත 1 පටුමග | ඩබ්ලිව්. එම්. චන්ද්‍ර තිලක, අංක191, කොළඹ පාර, ඉළුක්වත්ත,පිළිමතලාව | එච්. එම්. මුතුබණ්ඩා 575, ඉළුක්වත්ත පිළිමතලාව රණවනවත්ත කුඹුර පිළිමතලාව | පී. එම්. අත්තනායක 67/ඒ, සූරිය සෙවන ඉළුක්වත්ත | එච්. ඒ. යූ. හපුආරච්චිසූරිය සෙවන, ඉළුක්වත්ත පිළිමතලාව, පනන්ගේතැන්න | 0.58 | 2.40 |
| 32. | අක්කර අට ග්‍රාම නිලධාරි කාර්යාලය අසලින් ආරම්භ වන මාර්ගය | වයි. එම්. මයා, අංක 26/බී, උඩමා කඩවර, පාසල් පාර, ගනේතැන්න හිඟුල | එස්. එම්. ඉන්ද්‍රා කුමාරි 68/ඒ ඉළුක්වත්ත පිළිමතලාව | අයි. ජී. රංජනී, 19, ඉළුක්වත්ත, පිළිමතලාව | අයි. ජී. ජයසේන,135 ඉළුක්වත්ත, පිළිමතලාව නිදානවත්ත | 0.60 | 2.40 |
| 33. | රයියංග 2 පටුමග | කේ. එල්. රත්නසිරි අංක 422/බී ශ්‍රී ජිනරතන මාවත, පිළිමතලාව | නවරත්න මහතා ශ්‍රී ජිනරතන මාවත, පිළිමතලාව | ලයනල් ගමගේ 25, ජිනරතන මාවත, පිළිමතලාව | ප්‍රජාශාලාව | 0.64 | 2.40 |
| 34. | කහඹෙ හන්දියේ සිට දඹගැටේ ඇලවේල්ල දක්වා පාර | ඒ. ජී. අබේරත්න 79, පඩරුල්දෙණිය පිළිමතලාව | ඒ. ජී. ජයතිලක 79/1,පඩරුල්දෙනිය පිළිමතලාව | ඩබ්. පී. අජිත් ප්‍රේමලාල්, 6, පඩරුල්දෙණිය පිළිමතලාව | පී. ජී. සිරිසේන, 139, පිටියේ ගෙදර, පිළිමතලාව | 0.69 | 3.0 |

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | | අවසානය | | දිග | පළල |
|---|---|---|---|---|---|---|---|
| | | දකුණ | වම | දකුණ | වම | කි. මී. | කි. මී. |
| 35 | පරණාගල පන්සල පාර | අත්තුඩාවේ සීලානන්ද හිමි, පරනාගල පන්සල පිළිමතලාව | කේ. එම්. සුමිත් කුමාර, 427 කොළඹ පාර, පිළිමතලාව | ලලිතා ධනපාල විජේතුංග මාවත පිළිමතලාව මානදෙණිය පන්ගෝලලවත්ත | පී. ආර්. ටී. බණ්ඩාර 15, විජේතුංග මාවත පිළිමතලාව කෝරලේගෙදර වත්ත | 0.64 | 3.0 |
| 36 | මාලිගාතැන්න වත්ත අතුරු පාර | නිහාල් ගුණසේකර මයා "ධනංජය" අලගල්ලපාර, කඩුගන්නාව | අජන්ත කරුණාරත්න 127/10 අලගල්ල පාර කඩුගන්නාව | රංජිත් උභයරත්න ලියනගේ 441/1 මාලිගාතැන්නවත්ත අලගල්ල පාර කඩුගන්නාව | ෆවයිනා මොහිඩීන්, මවුන්ට්විව් මාලිගා තැන්නවත්ත අලගල්ල පාර, කඩුගන්නාව | 0.09 | 2.40 |
| 37 | මුදලිවත්ත වත්ත මාර්ගය | නගර සභා ඉඩම | ගැමුණු අබේසුන්දර මයා, මුදලිවත්ත පාර, කඩුගන්නාව | ඩී. එස්. චන්ද්‍රසිරි, අංක 237/2, මාලිගා තැන්නවත්ත මුදලිවත්ත පාර, කඩුගන්නාව | ඩී. එම්. පී. බී. දසනායක, අංක293, මාලිගාතැන්නවත්ත, මුදලිවත්ත පාර, කඩුගන්නාව | 0.21 | 2.40 |
| 38 | කිරිබෝව මාර්ගය | එම්. සී. එම්. හසීස් අංක316, කොළඹ පාර, කඩුගන්නාව | කේ. ජේ. ජයසිංහ අංක 320, කොළඹ පාර, කඩුගන්නාව | ඊ. පී. ගාමිණී ලියනගේ කඩවත්ගම කඩුගන්නාව | උපාලි ගුණසිංහ කඩවත්ගම, කඩුගන්නාව | 0.50 | 2.40 |

04-152

---

# අතුරු ව්‍යවස්ථා

## මහර ප්‍රාදේශීය සභාව

"මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම" පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හා "ඝන අපද්‍රව්‍ය කළමනාකරණය" පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විවිධිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (IX) වැනි උපවගන්තියේ (ච) ඡේදයෙන් "මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම" පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවලට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීමට මහර ප්‍රාදේශීය සභාවට බලය පැවරී ඇත.

තව ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 93 වැනි වගන්තිය සහ 126 වැනි වගන්තියේ 9 වැනි උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවලින් "ඝන අපද්‍රව්‍ය කළමනාකරණය" පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතනයේ (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා බස්නාහිර පළාතේ මහර ප්‍රාදේශීය සභාවට බලය පැවරී ඇත.

මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි "මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම" සහ "ඝන අපද්‍රව්‍ය කළමනාකරණය" පිළිබඳ අතුරු ව්‍යවස්ථා දෙක 2011 දෙසැම්බර් මස 06 වැනි දින පැවති මහ සභාවේ අංක (09) (02) යටතේ සභා සම්මත කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

සභාපති,
මහර ප්‍රාදේශීය සභාව.

2011 පෙබරවාරි මස 23 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහළ කරගහමුණ,
කඩවත.

04-139

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2012** | | | | | |
| අප්‍රේල් | 2012.04.05 | බ්‍රහස්පතින්දා | 2012.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.04.11 | බදාදා | 2012.03.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.04.20 | සිකුරාදා | 2012.04.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.04.27 | සිකුරාදා | 2012.04.11 | බදාදා | දහවල් | 12.00 |
| මැයි | 2012.05.04 | සිකුරාදා | 2012.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.11 | සිකුරාදා | 2012.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.18 | සිකුරාදා | 2012.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.25 | සිකුරාදා | 2012.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2012.06.01 | සිකුරාදා | 2012.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.08 | සිකුරාදා | 2012.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.15 | සිකුරාදා | 2012.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.22 | සිකුරාදා | 2012.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.29 | සිකුරාදා | 2012.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

F 5 – B 80374 (S/E)